ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේ**දනය**

### මහ **කොමසාරිස්තුමා** අග්‍රා හි **කේන්ද්‍රීය** හින්දි සංස්ථාන් **ආයතනයේ** පුහුණු වැඩසටහන සඳහා **තෝරාගන්නා** ලද හින්දි ගුරුවරුන් හමු වේ

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දියාවේ අග්‍රා හි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් ආයතනයේ පැවැත්වෙන හින්දි ගුරු පුහුණුව සඳහා තෝරා ගන්නා ලද හින්දි ගුරුවරුන් 35 දෙනා හමු විය. ශ්‍රී ලංකාව පුරා පිහිටි රජයේ පාසල්වල හින්දි ගුරුවරුන් සඳහා ඉන්දියාවේ පැවැත්වෙන ප්‍රථම පුහුණු වැඩසටහන මෙයයි. මෙම පුහුණු වැඩසටහන ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් අග්‍රා හි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් සමඟ එක්ව සංවිධානය කර තිබේ.

2. ශ්‍රී ලංකාවේ පාසල් 88ක හින්දි භාෂාව විෂයක් ලෙස ඉගැන්වේ. හින්දි භාෂා දැනුම සහ සංස්කෘතික අවබෝධය ඉහළ නැංවීම අරමුණු කරගත් මෙම වටිනා පුහුණු වැඩසටහන සඳහා රජයේ පාසල්වල හින්දි ගුරුවරුන් ශ්‍රී ලංකා රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තෝරා ගන්නා ලදී.

3. මෙම හමුවේදී මහ කොමසාරිස්තුමා ගුරුවරුන්ට සිය සුභාශිංසන පළ කළ අතර ශ්‍රී ලංකාවේ හින්දි අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ දැඩි කැපවීම සහ මාහැඟි දායකත්වය අගය කළේය. එසේම, එතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අධ්‍යාපනික සහ සංස්කෘතික බැඳීම් ශක්තිමත් කිරීමෙහිලා මෙම මුලපිරීමේ වැදගත්කම අවධාරණය කළේය.

4. මෙම ගුරුවරුන් ඉන්දිය රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රමුඛ පෙළේ ආයතනයක් වන අග්‍රා හි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් ආයතනයේ සුවිශේෂී පුහුණුවක් ලබනු ඇත. කේන්ද්‍රීය හින්දි සංස්ථාන් ගෝලීය වශයෙන් හින්දි භාෂාව ප්‍රවර්ධනය කිරීමට සහ ඉගැන්වීමට කැප වූ ආයතනයකි. මෙම පුහුණුව අතරතුර ආයතනය විසින් ගුරුවරුන් පිරිස සඳහා සංස්කෘතික සහ ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන වෙත සංචාර ද සංවිධානය කර ඇත. මෙම සුවිශේෂී වැඩසටහන අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා දෙරටෙහි කැපවීම සහ ශ්‍රී ලංකාව තුළ හින්දි භාෂා අධ්‍යාපනයට පවතින ඉහළ යමින් පවතින ප්‍රමුඛත්වය පිළිබිඹු කරයි.

****

**කොළඹ**
***2025** ජූලි **01***